wsws.org
World Socialist Web Site
Published by the International Committee of the Fourth International

# ශ්‍රී ලංකාවේ දේශපාලන අර්බුදය තවමත් විසඳී නැත

කේ. රත්නායක විසිනි
2003 නොවැම්බර් 15

---

රට තියුනු දේශපාලන අර්බුදයකට ඇද දමා යන්තම් සතියකට පසුව, ශ්‍රී ලංකාවේ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග, වත්මන් ගැටුම අවසන් කිරීමේ විධික්‍රම පිලිබඳව සාකච්ජා කරනු පිනිස බදාදා අගමැති රනිල් වික්‍රමසිංහ හමුවූවා ය.

පැය දෙකහමාරක් තිස්සේ පැවති රැස්වීමෙන් අනතුරුව කිසිවක් විසඳුනේ නැත. දෙපාර්ශ්වයම, සාකච්ජා "මිත්‍රශීලි හා සුහද" ඒවා ලෙස විස්තර කරමින් ද "විවිධ කරුනු පිලිබඳව අදහස් හුවමාරු වූ" බව ප්‍රකාශ කරමින් ද ආචාරශීලි ප්‍රකාශන නිකුත් කලේ ය. ඊලග සතියේ දී තව දුර සාකච්ජා පැවැත්වීමට නියමිත ය.

කිසිඳු එකගතාවක් ඇති කර නොගැනීම එතරම් මවිතයට කාරනාවක් නො වේ. අර්ථභාරී කරුන නම් කෙසේ වෙතත් එම රැස්වීම පැවැත්වීම ය. යන්තම් දින හතකට පෙරාතුව, කුමාරතුංග, ප්‍රධාන අමාත්‍යාංශ තුනක් පවරාගැනීමට, සොල්දාදුවන් වීදි බැස්සවීමට, පාර්ලිමේන්තුව සති දෙකකට කල් තැබීමට හා හදිසි නීතිය ප්‍රකාශ කිරීමට සිය අත්තනෝමතික ජනාධිපති බලතල යොදා ගති.

ඇයගේ තියුනු පිලිවෙත් වෙනස වනාහි, බලය ඩැහැගැනීමේ සිය අරමුනෙන් බැහැරව එක්සත් ජාතික පෙරමුනු (යූඑන්එෆ්) ආන්ඩුව සමග එකට වැඩ කිරීමේ එකගතාවක් ඇති කරගන්නා ලෙස ජනාධිපතිනිය මත යෙදෙන තියුනු පීඩනය පිලිබඳ සාක්ෂියකි.

ගැටුමේ හරි මැද පවතින්නේ රටේ දිග්ගැසුනු සිවිල් යුද්ධයයි. මහ බලවතුන් හා මහා ව්‍යාපාරිකයන් බල කරන්නේ, ව්‍යසනකාරි යුද්ධය අවසන් කොට භූගෝලීය ආර්ථිකයට රටේ ඒකාග්‍රකරනය පහසුකරවනු පිනිස දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග බලය බෙදාගැනීමේ එකගතාවක් ඇති කරගන්නා ලෙස යි. 2001 මැතිවරනය ජයගැනීමෙන් අනතුරුව, යූඑන්එෆ් ආන්ඩුව එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කොට සාකච්ජා ආරම්භ කලේය.

කුමාරතුංග, කෙසේ වෙතත්, ඇගේම පොදු පෙරමුනේ (පීඒ) කොටස්වලින් සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා සිහල උරුමය වැනි සිංහල අන්තවාදී කන්ඩායම්වලින් ඊනියා සාම ක්‍රියාදාමයට විරුද්ධ වන ලෙස නැගෙන ඉල්ලීම්වලට මුහුන දුනි. ඇය, යූඑන්එෆ් ආන්ඩුව ජාතික ආරක්ෂාව තර්ජනයට ලක් කොට ඇතැයි ද එල්ටීටීඊයට ඕනවට වඩා සහන දී ඇතැයි ද ප්‍රකාශ කරමින්, නොවැම්බර් 4 දා ආරක්ෂක, අභ්‍යන්තර කටයුතු හා මාධ්‍ය අමාත්‍යාංශ පවරා ගති.

එහෙත් දින දෙකකදී, හදිසි නීතිය පැනවීමේ සැලසුම් අකුලා ගැනීමට ජනාධිපතිනියට සිදු විය. එක්සත් ජනපදය, ජපානය, යුරෝපීය සංගමය හා එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අන්නන් යන සියල්ලෝ ම, ඊනියා සාම ක්‍රියාදාමය මත ඇති කරන ප්‍රතිවිපාක පිලිබඳව උත්සුකතා ප්‍රකාශයට පත් කලහ. ඉන්දියානු අගමැති අතාල් බෙහාරි වජ්පායි, කුමාරතුංග සමග මිනිත්තු 20ක දුරකතන සංවාදයක් පවත්වා ව්‍යවස්ථා අර්බුදයක් වලකාගන්නා ලෙස ඇගෙන් ඉල්ලා සිටියේ ය.

පසුගිය සිකුරාදා වික්‍රමසිංහ වොෂිංටනයේ සිට පෙරලා පැමිනියේ, ආන්ඩුවටත් එල්ටීටීඊය සමග එය ගෙනයන සාකච්ජාවන්ටත් එක්සත් ජනපද ජනාධිපති බුෂ් දුන් සහයෝගය පිලිබඳව පුරසාරම් දොඩමිනි. වෙලඳ ගිවිසුමක් හා සෙසු ආර්ථික පියවර ගනනාවක් අනතුරට ලක් විය හැකැයි ද එක්සත් ජනපදය පෙන්නුම් කර තිබේ. ඩොලර් මිලියන 567ක මූල්‍ය ආධාර ලබා දීමේ වැඩපිලිවෙලේ ඩොලර් මිලියන 80 ප්‍රථම කොටස ලැබීම සැක සහිත බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොලඹ නියෝජිත ජෙරමි කාටර් අනතුරු ඇගවී ය.

පසුගිය සතිය ම තියුනු දේශපාලන උපාමාරුවලින් ගහන විය. තමන් "සාම ක්‍රියාදාමයට" සහාය දෙන බවත් සටන් විරාමයට ගරු කරන ලෙස සන්නද්ධ හමුදාවන්ට අන කරන බවත් පසුගිය සිකුරාදා ජාතිය අමතා රූපවාහිනියෙන් කල කතාවක දී කුමාරතුංග අවධාරනය කලා ය. ඒ සමගම, ඇය ජාතික ආරක්ෂාවට යටින් වල කැපීම ගැන යූඑන්එෆ් ආන්ඩුවට බැන වැදීමේ දිගටම යෙදුනු අතර දේශ හිතේෂී ජාතික සමගි ආන්ඩුවක් තැනීම පිනිස සියලු පක්ෂවලට කැඳවුම් කලා ය.

වික්‍රමසිංහ සහ යූඑන්එෆ් ජාතික සමගි ආන්ඩුවක් සඳහා කල ඉල්ලීම ප්‍රතික්ෂේප කලේ ය. ඒ වෙනුවට, ඔවුහු, සාම ක්‍රියාදාමයේ වගකීම භාර ගන්නා ලෙස ජනාධිපතිනියගෙන් ඉල්ලා සිටීම මගින් ඇයව අවුලක හිර කොට ඇත. ආන්ඩුව අත රාජ්‍ය යන්ත්‍රනයේ පූර්න පාලනය

නැති නම් එය එල්ටිටීඊය සමග සාකච්ඡා කරන්නේ කෙසේ ද? යනුවෙන් කැබිනට් ලේකම් පී.එල්. පීරිස් ප්‍රශ්න කලේ ය. කුමාරතුංග විසින් පවරා ගන්නා ලද අමාත්‍යංශ තුනට මුදල් සැපයුම නතර කරනු පිනිස ආන්ඩුවට සිය මුදල් අමාත්‍යංශය යොදාගත හැකැයි ද ඔහු ඉගි කලේ ය. අලුත් මැතිවරනයක් කැඳවන ලෙස ද ආන්ඩුව ජනාධිපතිනියට අභියෝග කලේ ය.

එදිරිවාදිකම දිගටම පවතී. වත්මන් තත්වය තුල තමන්ට සාම සාකච්ඡා පිලිබඳ වගකීම භාර ගත නො හැකි යයි ආන්ඩුව සාම ක්‍රියාදාමයේ නෝර්වේජියානු සත්කාරකයන්ට දන්වා තිබේ. තමන්ගේම පක්ෂයේ කොටස් තමන්ගෙන් විරසක වේ යැයි ද ජවිපෙ සමග සන්ධානයකට ඇති හැකියාවට යටින් වලකැපේ යැයි ද භීතියට පත්ව කුමාරතුංග සාකච්ඡාවල වගකීම භාරගැනීම ප්‍රතික්ෂේප කර ඇත.

පසුගිය බදාදා පැවති හමුව කිසිදු එකගතාවක් ඇතිකරගැනීමට අපොහොසත් වූ නමුත්, වික්‍රමසිංහ හා කුමාරතුංග යන දෙදෙනා ම විසඳුමක් ඇති කරගන්නා ලෙස කෙරෙන පෙලඹවීම්වලට දිගටම යටත් කෙරී පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ලෝක බැංකුවේ හා ආසියානු සංවර්ධන බැංකුවේ නියෝජිතයෝ බදාදා ජනාධිපතිනිය මුන ගැසී, ආන්ඩුවේ ප්‍රතිව්‍යුහගතකරන සැලසුම් ද සමග සාම ක්‍රියාදාමය අඛන්ඩව ඉදිරියට යන වග සහතික කරන ලෙස ඇයගෙන් ඉල්ලා සිටියහ. ශ්‍රී ලංකාවේ අයවැය ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තුව නොවැම්බර් 19දාට යලි කැඳවීමට නියමිත ය.

නියෝජ්‍ය විදේශ ඇමති විඩාර් හෙල්ගසන් ඇතුලු නෝර්වේජියානු රාජ්‍යතාන්ත්‍රිකයන් පිරිසක්, යම් ආකාරයක එකගතාවක් වාත්තු කරගනු පිනිස සියලු පාර්ශ්වයන් හමුවීමේ යෙදී සිටී. නෝර්වේ, දේශපාලන ඇනහිටීම අවසානයකට ගෙන එන ලෙස අගමැති හා ජනාධිපතිනිය මත යෙදෙන පීඩනය උත්සන්න කරමින්, තමන් සාම සාකච්ඡා තුල සිය නිල මැදිහත්වීම අත්හිටුවා ඇතැයි සඳහන් කර තිබේ.

ඒකාබද්ධ ව්‍යාපාරික සභාව, මහා ව්‍යාපාරිකයන්ගේ ප්‍රධාන කොටස් නියෝජනය කරමින්. බ්‍රහස්පතින්දා වික්‍රමසිංහ හා කුමාරතුංග වෙත ලිපි යවා ඔවුන් සමග හදිසි හමුවීම් ඉල්ලා සිටියේ ය. පසුගිය සතියේ මෙම සංවිධානය, එකට වැඩ කරන ලෙස දෙපාර්ශ්වයෙන් ම ඉල්ලා සිටිමින් නිවේදනයක් නිකුත් කලේ ය. මෙම පියවරයන්ට පිටුපසින් පවතින්නේ, විදේශ ආයෝජන එකතැන හිරවන හා කොටස් අගයන් කඩා වැටෙන තතු යටතේ අඛන්ඩ දේශපාලන අස්ථාවරත්වය ආර්ථික සුවවීම පිලිබඳ මොනයම් හෝ බලාපොරොත්තුවකට අවසන් තිත තබනු ඇතැයි සංගත කව තුල පවත්නා ගැඹුරු උත්සුකතාවන් ය.

ඒකාබද්ධ ව්‍යාපාරික සභාවේ නිවේදනය වනාහි, යූඑන්එෆ් හා පොදු පෙරමුන සිය මතභේද අමතක කොට එල්ටිටීඊය සමග සාකච්ඡා පිලිබඳව ඒකාබද්ධ ප්‍රවිෂ්ඨයක් වර්ධනය කරගනු ඇති ජාතික සමගි ආන්ඩුවක් ගොඩනැගිය යුතු යයි ව්‍යාපාරික නායකයන් හා මාධ්‍ය වෙතින් ඔවුන් වෙත කෙරුනු ඉල්ලීම් මාලාවක මෑතම අවස්ථාවයි. නිදසුනක් ලෙස, පසුගිය සතියේ දී අයිලන්ඩ් පුවත්පතේ කතුවැකියක්, මෙම ඉල්ලීම යලි අවධාරනය කරමින් ම, මෙම පක්ෂ එකට එකතු වීම "ප්‍රාතිහාර්‍යයක්" වනු ඇතැයි යන කරුන ගැන ද වැලපුනි.

ඊනියා කම්කරු පක්ෂවලින් දෙකක් -- ලංකා සමසමාජ පක්ෂය (ලසසප) හා කොමියුනිස්ට් පක්ෂය -- "සහජීවන ආන්ඩුවක්" පිලිබඳ මහ බලවතුන්ගේ හා මහ ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම සමග අවිවේචනාත්මකව පෙල ගැසී තිබේ. "සාම ක්‍රියාදාමයට" ඔවුන් පුදන සහයෝගය මගින් ඇගවෙන්නේ, පුද්ගලීකරනය, ආන්ඩුවේ වියදම් කප්පාදුව හා රැකියා කප්පාදුව ඇතුලු විවෘත වෙලඳ පොල ප්‍රතිසංස්කරන සහිත යූඑන්එෆ් ආන්ඩුවේ පුලුල් වැඩපිලිවෙලට ඔවුන් දෙන නිහඬ සහායයි.

ජාතික සමගි ආන්ඩුවක් සඳහා බලගතු පීඩනයන් පවතින අතරතුර, වික්‍රමසිංහ හා කුමාරතුංග යන දෙදෙනාම උත්සුකව සිටින කරුනක් නම්, ඒකාබද්ධ ආන්ඩුවක් මගින් තමන් සිංහල අන්තවාදී සංවිධානවල දේශපාලන ප්‍රහාරයන්ට විවෘතව ලක්වීමේ ඉඩකඩ විවර කෙරෙන බවයි.

කුමාරතුංග සුවිශේෂවම මෙම ප්‍රහාරයන්ට ලක්වීමේ ඉඩකඩ වැඩි ය. මේ වන තෙක් ජවිපෙ හා සිහල උරුමය ඇය ජාතික ගැලවුම්කාරියක් ලෙස ප්‍රශංසාවට ලක් කර තිබේ. එහෙත් ඇය එල්ටිටීඊය සමග සාකච්ඡා කිරීමෙහි ලා යූඑන්එෆ් සමග ඒකාබද්ධ වුව හොත්, මෙවන් මනෝගතීන් ශීඝ්‍රයෙන් එහි ප්‍රතිවිරුද්ධය බවට පත්විය හැකි ය. අනෙක් අතට, කුමාරතුංග ජවිපෙ හා සිහල උරුමය අස්වැසීමට උත්සාහ කල හොත්, එල්ටීටීඊයට එරෙහිව වඩා දැඩි මිලිටරි පියවර ගනු පිනිස ආරක්ෂක ඇමතිනි ලෙස සිය බලතල පාවිච්චි කරන ලෙස කෙරෙන ඉල්ලීම්වලට මුහුන දීමට ඇයට සිදු වනු ඇත. එවන් පියවර යලි සටන් ඇවිලවීමේ හැකියාව සහිත ය.

එහි ප්‍රතිඵලයක් ලෙස, දේශපාලන තත්වය අතිශයින් ම ආතති සහගතව පවතී. බොහෝ විට, පසුගිය දින 10ක කාලය තුල වඩාත්ම සිත් කා වදින කාරනය නම්, එකදු පක්ෂයක් වත් -- ආන්ඩුව හෝ විපක්ෂය -- මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්, ශිෂ්ඨ සම්පන්න ජීවන තත්වයන් සහ ජාතිවාදී වෛරයෙන් නිදහස් සැබෑ සාමය සඳහා සාමාන්‍ය වැඩ කරන ජනයාගේ බහුතරය තුල පවත්නා අවශ්‍යතා සහ අභිලාෂයන් ගැන මොනම සඳහනක් වත් නො කිරීම යි.

© ලෝක සමාජවාදී වෙබ් අඩවිය